# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව

# ඇබෑර්තු

## හෘදරෝග නිර්වින්දන විශේෂඥ වෛද්‍ය තනතුර

**මෙය 2021.08.09 වන "ඉරිදා ඔබ්සවර්", "සිළුමිණ" සහ "තිනකරන්" පුවත්පත්වල ඉහත කරුණ පිළිබඳ පළකරන ලද දැන්වීමෙහි දිනයන් දීර්ඝ කිරීමකි. ඔබ 2021.08.29 වන දින පළකරන ලද දැන්වීමට අනුව ඉහත තනතුර සඳහා දැනටමත් අයදුම්කොට ඇත්නම් නැවත අදුම්කිරීමට අවශ්‍ය නොවන බව කරුණාවෙන් සළකන්න.**

### *ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.*

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ උසස් හෘද රෝග මධ්‍යස්ථානය, උසස් තිමාවේ, ඉහළ පරිමාවේ වැඩිහිටි හෘද රෝග ශල්‍යකර්ම වසරකට 500 කට වැඩි සංඛ්‍යාවක් සිදු කරනු ලබන ප්‍රමුඛ පෙළේ හෘද රෝග මධ්‍යස්ථාන වලින් එකකි. එහි ඇඳන් 12 ක දැඩි සත්කාර ඒකකයක් (ICU) හා ඇඳන් 06 ක විශේෂ ප්‍රතිකාර ඒකකයක් (HDU) ද ඇත. සාර්ථක අයදුම්කරුට හෘද රෝග නිර්වින්දන වෛද්‍යවරයා ලෙස හුරුපුරුදු කාර්යයන්ට අමතරව හෘද උරිස් (කාඩියෝ තොරසික් - Cardio Thoracic) කාර්ය භාර වෛද්‍යවරයා ලෙසද කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වේ. එම නිසා, ඉහත ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.

| | | |
|---|---|---|
| **සුදුසුකම්** | : | වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) තීරක මණ්ඩල සහතිකකරණය හෝ තීරක මණ්ඩල සහතිකකරණයේ වරප්‍රසාද සඳහා හිමිකම් තිබීම. හෘද රෝග නිර්වින්දනය පිළිබඳ විශේෂ පුහුණුවීම් / පළපුරුද්ද සහ අයදුම්කරුවන්හට ප්‍රමුඛතාවය හිමිවේ. |
| **වයස** | : | අයදුම්කරුවන් වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. වයස 50 ට අඩු අයදුම්කරුවන් නොමැති නම් වයස 50 ට වැඩි අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනමින් පත්කිරීමට සළකා බලනු ලැබේ. |
| **වැටුප් පරිමාණය** | : | රු. 118,800 - 12X3,645 - 162,540/- මාසිකව<br>මීට අමතරව රාජ්‍ය අංශයේ ගෙවනු ලබන අමතර දීමනා හා අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කළ අමතර දීමනාද ගෙවනු ලැබේ. |
| **රැකියා නියුක්තියේ නියමයන්** | : | ස්ථිර (අවුරුදු 50 ට අඩු) හා සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් පදනම මත. |

රාජ්‍ය සේවයේ තනතුරු හොබවන අයදුම්කරුවන් තම අයදුම්පත් ඔවුන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද පිටපතක් ඍජුවම ද එවිය යුතුය. අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් පත්වීම සඳහා ඔහු මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියාගෙන් සහතිකයක් අයදුම්පතට අමුණා එවිය යුතුය.

පත්වීමක් ලබාදීම හෝ ලබා නොදීම පිළිබඳ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

සම්පූර්ණ ජීවදත්ත හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් සහිත තම අයදුම්පත් අයදුම්කරුවන් විසින් 2021.10.21 දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**

**2021 .10.12**